දිවි තොර කරගැනීම් මහජන සෞඛ්‍ය ගැටළුවක් සේ සලකා වාර්තා කිරීම අවශ්‍ය වේ. දිවි තොර කර ගැනීම් වාර්තා කිරීම් ඔස්සේ, අනුකාරක දිවි තොර කර ගැනීම් සිදුවීම වැළැක්වීමේ වගකීම ද මාධ්‍ය පවතී. දිවි තොර කර ගැනීම් වාර්තා කිරීම සඳහා හඳුන්වා දී ඇති මාධ්‍ය ආචාර ධර්ම පිළිපැදීම අත්‍යවශ්‍ය වන්නේ ඒ හෙයිනි.
කෙසේ වෙතත් තවමත් ඇතැම් මාධ්‍ය, දිවි තොර කර ගැනීම් වාර්තා කිරීමේදී, එම ආචාරධර්ම උල්ලංඝනය කරනු දක්නට ලැබේ.
නිදසුන් ලෙසින්, තෝරා ගත් සිංහල භාෂා පුවත්පත් තුළ, ජනවාරි 23-27, 2023 සතියේදී, වාර්තා වූ දිවි තොර කරගැනීම් පිළිබඳ මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනය කිරීම් පෙන්වා දිය හැක.
ඒ අනුව, මෙම පුවත්පත් තුළ, දිවි තොර කර ගැනීම් වාර්තාකරණය පිළිබඳ පහත උල්ලංඝනයන් දක්නට ලැබිණි.
* දිවි තොර කර ගත් ආකාරය සිරස්තලය තුළ සඳහන් කිරීම්
*දිවි තොර කර ගත් ආකාරය පුවත් අන්තර්ගතය තුළ සඳහන් කිරීම්,
* ප්‍රමුඛතාවයෙන් යුතුව (පුවත්පත් මුල් පිටුව තුළ) දිවි තොර කරගැනීම් ඉදිරිපත් කිරීම්,
* උපකාරක අංක සඳහන් නොකිරීම්,
එසේ නම්, මෙම දිවි තොර කරගැනීම් පිළිබඳ වාර්තාකරණයන් වගකීම් සහගත යැයි ඔබ සිතන්නේද?
උපකාරක අංකයක් සඳහන් කරමු, ජීවිතයක් රැකගනිමු!
හදිසි උපකාරක අංක:
* CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
* ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)
මූලාශ්‍ර:
https://apps.who.int/.../258814/WHO-MSD-MER-17.5-eng.pdf
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://accountablejournalism.org/.../australia-standards...